# ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

**වාර්ෂික වාර්තාව 2023**

## ස්තූතිය..

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු උදෙසා අවශ්‍ය පහසුකම් හා මූල්‍ය සහාය ලබාදීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශයේ පර්යේෂණ හා නව නිපැයුම් අංශය වෙත කළමනාකාරිත්වය විසින් සිය කෘතඥතාවය පළ කරනු ලබයි. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු සිදු කිරීමෙහි ලා එහි කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් ලබාදුන් සහාය හා උපකාරය කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන් විසින් අගය කොට සලකනු ලබයි.

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව පිළිබඳව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්ෂණ කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති සම්පාදනය කරන හා උපදෙස් සපයන ප්‍රමුඛ ආයතනය ලෙස නම් කරනු ලැබ ඇත. කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබන සාමාජිකයන් සත් දෙනෙකුගෙන් සමන්විත වේ.

### පරිශ්‍රයේ ලිපිනය

හයවන මහල, D කොටස, "සෙත්සිරිපාය" II වන අදියර, බත්තරමුල්ල

### ඇමතුම් තොරතුරු

011- 2186711

011- 2186713

info@nastec.gov.lk

www.nastec.gov.lk

ලංකා බැංකුව, හයිඩ් පාක්

විගණකාධිපති දෙපාර්තමේන්තුව

# පටුන


ස්තුතිය.. ........................................ 2

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව පිළිබඳව ........................................ 3

රූප සටහන් ........................................ 5

**වගු ලැයිස්තුව** ........................................ 5

(1994 අංක 11 දරන) විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් නියම කරන ලද කර්තව්‍යයන් ........................................ 6

විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ පැතිකඩ ........................................ 8

**ආයතනික ව්‍යූහය** ........................................ 9

**සභාපතිවරයාගේ සමාලෝචනය** ........................................ 10

අධ්‍යක්ෂක තුමියගේ සමාලෝචනය ........................................ 12

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය – 2023 ........................................ 17

කාර්ය සාධනයේ විශේෂ වැඩසටහන් - 2023 ........................................ 18

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (1): විද්‍යාව හා තාක්ෂණය ගොඩනැගීම සඳහා අවශ්‍ය සැලසුම් ප්‍රතිපත්ති හා පිළිබඳව රජයට උපදෙස් ලබාදීම ........................................ 18*

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (2): ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම ........................................ 19*

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (3): විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම ........................................ 19*

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (4): විද්‍යා හා තාක්ෂණ ආයතනයනට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ රජයට උපදෙස් ලබාදීමට ප්‍රථම අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතන විමසීම ........................................ 22*

***ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (5): විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ද්විවාර්ෂික සමුළුව (BICOST) කැඳවීම*** ........................................ 29

ජාත්‍යන්තර කටයුතු ........................................ 31

*බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු-ආංශික තාක්ෂණික ආර්ථික සහයෝගිතාව සඳහා එකමුතුව (BIMSTEC) ........................................ 31*

මානව සම්පත් කළමනාකරණය ........................................ 35

කාර්ය මණ්ඩල පුවත් ........................................ 35

ධාරිතා ගොඩනැගීම /ගෘහස්ථ සහ බාහිර පුහුණු වැඩසටහන් ........................................ 35

සුභසාධන කටයුතු ........................................ 36

ආයතනික පාලන වාර්තාව ........................................ 36

විගණන හා කළමනාකරණ කමිටුව ........................................ 37

මූල්‍ය ප්‍රකාශනය ........................................ 38

විගණකාධිපති වාර්තාව ........................................ 42

**පසුගිය වසර 10 හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ** ........................................ 49

## රූප සටහන්


රූපය 1: පනත හා නීති, දැක්ම හා මෙහෙවර ........................................ 6
රූපය 2: ආයතනික ව්‍යුහය ........................................ 9
රූපය 3: විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව 2019 සහ 2020 ........................................ 19
රූපය 4: ජා.වි.හා තා.කො.ස. සමාලෝචන වාර්තා නිල වශයෙන් ගරු අමාත්‍යතුමාට පිළිගැන්වීම ........................................ 20
රූපය 5: පරිසරගෝලයේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය ........................................ 24
රූපය 6: ශාක ව්‍යාධිජනක දිලීර අධ්‍යයනය කිරීම සඳහා DNA අනුක්‍රමික දත්ත භාවිතා කිරීමේ දියුණුව පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය ........................................ 25
රූපය 7: සාර්ථක උපාධි විද්‍යාල අයදුම්පතක් ලියන ආකාරය පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය ........................................ 26
රූපය 8: ශාස්ත්‍රීය ප්‍රකාශන පැතිකඩ පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය ........................................ 27
රූපය 9: ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ වැඩමුළුව ........................................ 28
රූපය 10: YSF තේමාත්මක විද්‍යුත් ප්‍රකාශනය - ආර්ථික පරිවර්තනය වේගවත් කිරීම සඳහා බහුආංශික ප්‍රවේශයන් ........................................ 28
රූපය 11: YSF තේමාත්මක විද්‍යුත් ප්‍රකාශනය - ආර්ථික පරිවර්තනය වේගවත් කිරීම සඳහා බහුආංශික ප්‍රවේශයන් ........................................ 29
රූපය 12: දසවන ද්වීවාර්ෂික සමුළුවේ තාක්ෂණික නිමැවුම් වාර්තා ........................................ 30
රූපය 13: බිම්ස්ටෙක් සඳහා S&T පිළිබඳ පළමු විශේෂඥ රැස්වීම ........................................ 31
රූපය 14: බිම්ස්ටෙක් හිමාලයානු විද්‍යා කවුන්සිලයේ දෙවන විශේෂඥ රැස්වීම ........................................ 31
රූපය 15: නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය මධ්‍යස්ථානයේ 16 වන පාලක සභාව ........................................ 32
රූපය 16: මූල්‍ය ප්‍රකාශනය ........................................ 39
රූපය 17: පෙර වසර 10 (2013-2022) හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ ........................................ 49


### වගු ලැයිස්තුව


වගුව 1: පෙර වසර 10 (2014-2023) හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ ........................................ 49

## (1994 අංක 11 දරන) විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් නියම කරන ලද කර්තව්‍යයන්

**පනත හා නීති**

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා පනත මගින් ස්ථාපනය කරන ලද අතර, 1998 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වේ. 1998 දෙසැම්බර් මස 06 වන දින විධිමත් පරිදි අරඹන ලද එය 1999 ජනවාරි මාසයේදී සක්‍රිය කොමිෂන් සභාවක් බවට පත්විය.**

**දැක්ම**

"ශ්‍රී ලාංකික ජනතාවගේ යහපත හා සමෘද්ධිය නංවාලනු පිණිස වූ විභවතාව හා ඒ සඳහා විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම සඳහා රජයට උපදෙස් ලබාදෙන අති විශිෂ්ට උපදේශක ආයතනයක් බවට පත්වීම."

**මෙහෙවර**

"තිරසර සංවර්ධනය උදෙසා, ජාතික වශයෙන් විද්‍යා හා තාක්ෂණ අංශයන්ගේ හැකියාවන් වර්ධනය උදෙසා රජය වෙත ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා සැලසුම් සම්පාදනය"

*රූපය 1: පනත හා නීති, දැක්ම හා මෙහෙවර*

## NASTEC පනත ප්‍රකාරව පැවරී ඇති කාර්යභාරයන්

- පහත සඳහන් ක්ෂේත්‍රයනට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් ද ඇතුළත්ව විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබාදීම:
  - ආර්ථික වෘද්ධිය උත්තේජනය කරනු පිණිස විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම;
  - කර්මාන්ත, කෘෂිකර්ම, සේවා හා ආර්ථික ක්ෂේත්‍රයනට අදාළ කාර්යක්ෂමතාවය හා තරඟකාරිත්වය සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ අංශයේ බලපෑම;
  - ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවනු පිණිස සෞඛ්‍ය, පෝෂණ හා දුගීබව දුරුලීම යන ක්ෂේත්‍රයන් මත විද්‍යාවේ හා තාක්ෂණයේ බලපෑම;
  - අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ සඳහා වගකිව යුතුවන බලධාරීන් විමසමින් විද්‍යාව හා තාක්ෂණය සඳහා අවශ්‍ය මානව හා සෙසු සම්පත් සංවර්ධනය;
  - ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංවර්ධනය හා කළමනාකරණය;
  - ජාතික වැදගත්කමකින් යුතු විය හැකි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා ප්‍රමුඛතාගතකරණය;
  - විද්‍යා හා තාක්ෂණ ප්‍රවීණත්වය ගොඩනැගීම, පවත්වා ගැනීම හා ආකර්ශනය සඳහා තුඩු දෙන පරිසරයක් නිර්මාණය කිරීම;
  - විද්‍යාව හා තාක්ෂණය ඵලදායක ලෙස යොදාගැනීම සඳහා තුඩුදෙන කළමනාකරණ ක්‍රමෝපායන් ස්ථාපනය;
  - විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි පර්යේෂණ සඳහා අවශ්‍ය අරමුදල්කරණය සඳහා ප්‍රමුඛත්වය ලබාදීම ඇතුළත්ව විද්‍යාව හා තාක්ෂණය සඳහා අරමුදල් වෙන් කිරීම.

- පෙර වසරේ ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ක්‍රියාමාර්ගයන්හි ඵලදායකත්වය, විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි කාර්ය සාධනය, විද්‍යාව හා තාක්ෂණය සඳහා වූ රජයේ වියදම්හි ඵලදායකත්වය හා රාජ්‍ය අංශය විසින් විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධයෙන් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම;
- විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 2වන කොටස තුළ දක්වා ඇති අරමුණු සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණික ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය;
- විද්‍යා හා තාක්ෂණික ආයතනයන්ට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීමට ප්‍රථම එවන් අදාළ ආයතනයන්හි අදහස් විමසීම;
- අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය සහිතව වසර දෙකකට වරක් ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සමුළුව කැඳවා පනතේ 2වන කොටස තුළ දක්වා ඇති අරමුණු හා සම්බන්ධව ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ සංසදයක් ඇති කිරීම ; හා එම සාකච්ඡාවන් සම්බන්ධ වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

## විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ පැතිකඩ

- *සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධානියා වේ.*


- *අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරියා වේ.*

- *ආංශික ප්‍රතිත්ති, ක්‍රමෝපාය සැලසුම් හා සෙසු විද්‍යා හා තාක්ෂණ ආශ්‍රිත ලේඛන සකසා ඉදිරිපත් කරනු වස් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයෝ හා විද්‍යාඥයෝ පාර්ශවකරුවන් හා උපදේශාත්මක සංසද සමග කටයුතු කරති.*

- *නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල් හා පරිපාලන) විසින් මූල්‍ය හා පරිපාලන කටයුතු මෙහෙයවනු ලබයි.*

- *පනත මගින් බලය ලබාදී ඇති පරිදි විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ආයතනික සමාලෝචන කාර්යයන් සිදුකරනු පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් පෙළ ගස්වනු ලබයි.*

## ආයතනික ව්‍යුහය




*රූපය 2: ආයතනික ව්‍යුහය*

## සභාපතිවරයාගේ සමාලෝචනය

විද්‍යාව හා තාක්‍ෂණයට අදාළ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ ඉහළම ප්‍රතිපත්ති උපදේශක ආයතනය ලෙස කටයුතු කරන ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව, සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා සිය කාර්යභාරය සිදු කරමින් තවත් සාර්ථක වසරක් සම්පූර්ණ කර ඇති බව වාර්තා කිරීමට සතුටු වෙමි. කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස, 2023 වර්ෂය සඳහා ආයතනයේ ජයග්‍රහණ උදෙසා දරන ලද නොපසුබට උත්සාහය සඳහා නිලධාරී මණ්ඩලයට මගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.

2022 ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාකාරකම් අඛණ්ඩව කරගෙන යාමත් සමඟ, 2023 දී, කොමිෂන් සභාව විසින් ජිනෝම (Genome) මධ්‍යස්ථාන හා ජිනෝම (Genome) දත්ත ගබඩාව සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සකස් කරන ලදි. ශ්‍රී ලංකාවේ දේශීය සෞඛ්‍ය ප්‍රතිපත්තිය සහ ජාතික ඛනිජ ප්‍රතිපත්තිය සැකසීමේ ක්‍රියාවලීන් සඳහා උපදේශන කාර්ය වෙනුවෙන් පහසුකම් සපයන ලදී. ප්‍රතිපත්ති නිර්දේශ සැපයීමේ අරමුණින් 2023 වසර සඳහා කෘෂිකර්මය, බලශක්තිය, ඛනිජ අගය එකතු කිරීම, දේශගුණික විපර්යාස, සහ පෝෂණ ද්‍රව්‍ය වැනි ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී.

ආයතනික කාර්යභාරය අනුව කොමිෂන් සභාව විසින් කාර්ය සාධන ඇගයීම්, විද්‍යා හා තාක්ෂණ දත්ත රැස් කිරීම සහ උපදේශන සංසද වැනි ක්‍රම මාලාවක් මගින් තීරණ ගැනීම් හා දැනුවත් කිරීම් සාර්ථකව සිදු කරන ලදි. 2023 දී කාර්ය සාධන සමාලෝචන තුනක් අලුතින් ආරම්භ කරන ලද අතර කොමිෂන් සභාව විසින් 2019 සහ 2022 අතර සිදු කරන ලද කාර්යසාධන සමාලෝචන සඳහා ආයතනික සමාලෝචන වාර්තා හයක් නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. විශේෂ සමරු උත්සවයක් ලෙස, පසුගිය වසර පහ තුළ (2017-2021 ) කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලද හොඳම ක්‍රියාකාරී ආයතන සඳහා සම්මාන දෙකක් ලබා දෙන ලදී. 2021 සහ 2022 සඳහා දත්ත රැස් කිරීම ආරම්භ කරන අතරතුර 2019 සහ 2020 විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තා ප්‍රකාශයට පත් කර ශ්‍රී ලංකාවේ විද්‍යාර්ථීන් වෙත බෙදා හරින ලදී.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ අනුග්‍රහය යටතේ, විද්‍යා හා තාක්‍ෂණය පිළිබඳ 09 වැනි ද්විවාර්ෂික සමුළුව (BICOST IX) 2023 මාර්තු මාසයේදී පැවැත්විණි. සමුළුවේ තේමා පාඨය වූයේ "දේශගුණික විපර්යාස හමුවේ තිරසාර සංවර්ධනය සඳහා විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදනය" යන්නයි.එම සමුළුව මගින් රටෙහි තීරණාත්මක මාතෘකා පිළිබඳ තාක්ෂණික වාර්තා 4 ක් ඉදිරිපත් විය. තරුණ විද්‍යාඥයින්ගේ සංසදය පර්යේෂණ සම්මන්ත්‍රණ, මාර්ගගත සම්මන්ත්‍රණ (webiner) සහ කුසලතා සංවර්ධන වැඩමුළු ඇතුළු ක්‍රියාකාරකම් හරහා රටේ තරුණ විද්‍යාඥයින් සවිබල ගන්වන ලදී.

ජාත්‍යන්තර සහයෝගීතාවයේ කොටසක් ලෙස, 2023 ජුනි 21 වන දින, බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව (BIMSTEC) විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සිය පළමු විශේෂඥ රැස්වීම සහ BIMSTEC යටතේ හිමාලයානු විද්‍යා කවුන්සිලයේ දෙවන විශේෂඥ රැස්වීම 2023 ජුලි 26 වැනි දින ද පවත්වන ලදී. කොමිෂන් සභාවෙහි සම්බන්ධීකරණය යටතේ ඉන්දියාවේ නාම් විද්‍යා හා තාක්ෂණ (NAM S&T) මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ ශිෂ්‍යත්ව සඳහා ශ්‍රී ලංකාවෙන් විද්‍යාඥයින් 11 දෙනෙකුට සහභාගී වීමට හැකියාව ලැබුණි. මොරිෂස් හි

පැවති NAM S&T මධ්‍යස්ථානයේ 16 වන පාලක සභාව සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සහභාගී වූ අතර, කොමිෂන් සභාව සම්බන්ධීකරණයේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරයි.

මෙම කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන්, කොමිසමේ නායකත්වය සහ මඟපෙන්වීම යටතේ අපගේ ආයතනය සාර්ථක වූ ආකාරය සෘජුව දැක බලා ගැනීමේ භාග්‍ය මා හට හිමි වී ඇත. කොමිෂන් සභාවෙ කාර්ය මණ්ඩලයේ නොසැලෙන කැපවීම හා අවශ්‍ය කාර්යයන් නියමිත වේලාවට සම්පූර්ණ කිරීම ආයතනයට ඉමහත් දායකත්වයක් වුණි.

අනාගතයේදි ද කොමිෂන් සභාව සිය සියලු ක්‍රියාකාරකම් සාර්ථකව ඉටු කරනු දැකීම මගේ බලාපොරොත්තුවයි.

**මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න**
සභාපති

## අධ්‍යක්ෂක තුමියගේ සමාලෝචනය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC), 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ විධි විධානවලට අනුකූලව, විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව සඳහා ශ්‍රී ලංකා රජයට (GoSL) ප්‍රතිපත්තිමය උපදෙස් සහ උපාය මාර්ගික මඟ පෙන්වීම් ලබාදීමේ සිය කාර්යභාරය අඛණ්ඩව ඉටුකර ඇත. ජාතියේ විද්‍යා හා තාක්ෂණික දියුණුව ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් කරන ලද වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කළ බැවින් 2023 වසර කොමිෂන් සභාව සඳහා තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය.

කොමිෂන් සභාව විසින් 2023 දී විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සංවර්ධනයට දායක වීම අඛණ්ඩව සිදු කරන අතර, එම වැඩසටහන් සඳහා පදනම දමයි. ඒවා නම් ජිනෝම (Genome) මධ්‍යස්ථානය හා ජිනෝම (Genome) දත්ත ගබඩාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ජාතික දේශීය සෞඛ්‍ය ප්‍රතිපත්තිය සැකසීම සඳහා උපදේශක භූමිකාව සැපයීම වේ. 09 වැනි ද්විවාර්ෂික සමුළුව (BICOST-IX) පසු කටයුතු ලෙස පහත ක්ෂේත්‍රවලට අදාලව ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ අවධානය යොමු කරන ලදී.එනම් කෘෂිකර්මාන්තය, පිරිසිදු බලශක්තිය, ඛනිජ අගය එකතු කිරීම, දේශගුණික විපර්යාස හා ආවේණික ජෛව වලින් පෝෂ්‍ය පදාර්ථ යනාදියයි.

සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනයට සහය දැක්වීමට සමගාමීව, කාර්යසාධන ඇගයීම් සහ උපදේශන සංසද ක්‍රියාකාරකම් ගණනාවක් ඇතුළත් කිරීමට කොමිෂන් සභාව විවිධ ප්‍රවේශයන් අනුගමනය කරන ලදි. 2023 දී, නව ආයතනික කාර්යසාධන සමාලෝචන තුනක් ආරම්භ කරන ලද අතර, 2019 සහ 2022 ආයතනික සමාලෝචන හයක් අවසන් කරන ලදී. කැපී පෙනෙන ජයග්‍රහණයක් ලෙස, කොමිෂන් සභාව විසින් 2017 සහ 2021 අතර සමාලෝචනය කරන ලද හොඳම කාර්යසාධනයක් පෙන්වූ ආයතන ඇගයීම සඳහා සම්මාන උළෙලක් සංවිධානය කරන ලදී. 2019 සහ 2020 විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තා, හා 2021 සහ 2022 වාර්තා එළි දැක්වීම තුළින් විද්‍යාර්ථීන් උදෙසා වටිනා තොරතුරු ලබා දෙයි.

විද්‍යාව හා තාක්‍ෂණය පිළිබඳ 09 වැනි ද්විවාර්ෂික සමුළුව (BICOST IX) ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එය 2023 වසරේ විශාල ජයග්‍රහණයක් විය. මෙම සමුළුව "දේශගුණික විපර්යාස හමුවේ තිරසාර සංවර්ධනය සඳහා වූ විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදනය" යන තේමාව යටතේ සිදු කරන ලදී. මෙම සම්මන්ත්‍රණයේ ප්‍රතිපල ලෙස තාක්ෂණික වාර්තා හතරක් ඉදිරිපත් විය.

ඊට සමගාමීව, තරුණ විද්‍යාඥයින්ගේ සංසදය (YSF) විසින් 11 වැනි වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය, ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුවේ (NRDF) දක්වා ඇති කේන්ද්‍රීය කරුණු 10 හා ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියට අනුගතව සංවිධානය කරන ලදි.

කොමිෂන් සභාව විසින් විද්‍යා හා තාක්ෂණය පිළිබඳ පළමු විශේෂඥ කණ්ඩායම් රැස්වීම සහ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව (BIMSTEC) යටතේ හිමාලයානු විද්‍යා කවුන්සිලයේ දෙවන විශේෂඥ කණ්ඩායම් රැස්වීම ද කැඳවන ලදී. කොමිෂන් සභාවෙහි සම්බන්ධීකරණය හරහා ඉන්දියාවේ නාම් විද්‍යා හා තාක්ෂණ (NAM S&T) මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ ශිෂ්‍යත්ව සඳහා ශ්‍රී ලාංකික විද්‍යාඥයින් ගණනාවක් සහභාගී විය. තවද, මොරිෂස් හි පැවති නාම් විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 16 වන පාලක සභා රැස්වීමේදී ශ්‍රී ලංකාවේ නියෝජිත කේන්ද්‍රස්ථානය ලෙස කොමිෂන් සභාව කටයුතු කළේය.

මෙම ජයග්‍රහණ ලැබීම කොමිෂන් සභාවෙ කාර්ය මණ්ඩලයේ කැපවූ කණ්ඩායම් ක්‍රියාකාරීත්වයෙහි ප්‍රතිඵලයකි. එබැවින්, ඔවුන්ගේ මගපෙන්වීම සහ දැක්ම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ ගෞරවනීය සාමාජිකයින්ට මම මගේ හෘදයාංගම කෘතඥතාව පුද කරමි. අපගේ ජයග්‍රහණ සඳහා කොමිසමේ නොසැලෙන කැපවීම ද මම අගය කරමි.

කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරයට අනුකූලව විද්‍යාව හා තාක්ෂණය ඉදිරියට ගෙන යමින් එහි මෙහෙවරෙහි විශිෂ්ට ලෙස ඉදිරියට යනු ඇතැයි මාගේ විශ්වාසයයි.

ගීතානි එස් කන්නන්ගර
වැඩ බලන අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
2024 අගෝස්තු 23

# කොමිෂන් සභා සභාපතිතුමන් සහ සාමාජිකයෝ



**මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න**

**කොමිෂන් සභා සභාපති**

මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න මහතා රසායන විද්‍යාව පිළිබඳ කීර්තිමත් සම්මානනීය මහාචාර්යවරයකු වන අතර දැනට SLTC පර්යේෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ ප්‍රධාන විධායක නිලධාරියා වේ.

දැනට ඔහු ව්‍යවස්ථාපිත මණ්ඩල ගණනාවක සේවය කරයි.



**දීපා ලියනගේ මහත්මිය**

**කොමිෂන් සභා සාමාජික**

දීපා ලියනගේ මහත්මිය අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්වරියකි



**ආචාර්ය ඩී.එම්. සුරතිස්ස දිසානායක**

**කොමිෂන් සභා සාමාජික**

ෆොසිල ජීව විද්‍යාඥයෙකු වන ආචාර්ය ඩී.එම්.සුරතිස්ස දිසානායක මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශයට අනුයුක්තව සේවය කරයි. ඔහු මේ වන විට ද්විතීයන පදනම මත ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් කටයුතු කරයි.



**මහාචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර**
**කොමිෂන් සභා සාමාජික**

ජාතික මූලික අධ්‍යයන ආයතනයට අනුයුක්ත පර්යේෂණ මහාචාර්යවරයෙකි.



**ආචාර්ය කේ.ජී.අයි. අමරසිංහ**
**කොමිෂන් සභා සාමාජික**

ආචාර්ය කේ.ජී.අයි. අමරසිංහ මහතා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ හිටපු ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරි වේ.



**ආචාර්ය නිර්මලී ද සිල්වා මහත්මිය**
**කොමිෂන් සභා සාමාජික**

ශ්‍රී ලංකාවේ ඇඟලුම් හා විලාසිතා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පෙරමුණෙහි කටයුතු කොට ඇති ආචාර්ය නිර්මලී ද සිල්වා මහත්මිය වරලත් රෙදිපිළි තාක්ෂණවේදිනියකද වන අතර, තත්ත්ව හා ඵලදායකත්ව සංකල්ප හා සහතිකකරණය පිළිබඳ සංකල්ප ප්‍රවර්ධනය කරන්නියක ද වේ.



**තුෂාර වජිර පෙරේරා මහතා**
**කොමිෂන් සභා සාමාජික**

තුෂාර වජිර පෙරේරා මහතා ලංකා රජයේ අතිගරු ජනාධිපතිවරයාගේ විද්‍යා කටයුතු පිළිබඳ උපදේශකවරයෙකි. මේ වන විට ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ (SLINTEC) ප්‍රධාන විධායක නිලධාරියා හා ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් සේවය කරන ඒ මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකු වේ.

## භාණ්ඩාගාර නියෝජිතයෝ



**දිලූපා ප්‍රනාන්දු මහත්මිය**
**භාණ්ඩාගාර නියෝජිත**

දිලූපා ප්‍රනාන්දු මහත්මිය මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙහි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක වේ.

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය – 2023

| | |
|---|---|
| **මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න මහතා** | සභාපති |
| **ජනක එස්. ගීකියනගේ මහතා** | වැඩබලන අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.(2023 නොවැම්බර් 13 දක්වා) |
| **ජී.එස්. කන්නන්ගර මිය** | වැඩබලන අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි. (2023 නොවැම්බර් 14 සිට) |
| **සෙයිඩ් ෂහමි මහතා** | ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ |
| **ජී.සී. කුමාරි පීරිස් මිය** | නියෝජ්‍ය අධ්‍යක්ෂ- මුදල් හා පරිපාලන |
| **එම්.ඩී. තිළිණි මිය** | විද්‍යාඥ |
| **රසිතා පෙරේරා මිය** | විද්‍යාඥ |
| **යූ.කේ.ඩී. එල්. එච්. කේ. උඩුගම මිය** | පරිපාලන නිලධාරී |
| **එස්. ඒ. ඩී. එස්. පී. සේනානායක මහතා** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ දත්ත ගබඩා සහකාර |
| **ආර්. එම්. ටී. රත්නායක මහතා** | වැඩසටහන් සහකාර - මුදල් |
| **අනිල් හෙට්ටිආරච්චි මහතා** | රියැදුරු |
| **ජයශාන්ත ප්‍රභාත් මහතා** | රියැදුරු |
| **එරන්ද ප්‍රදීප් මහතා** | රියැදුරු |
| **ඒ.ඩී. ධනපාල මහතා** | කාර්යාල කාර්ය සහායක |
| **අයි.පී.සී.යූ. ඉලංගකෝන් මහතා** | කාර්යාල කාර්ය සහායක |

## කාර්ය සාධනයේ විශේෂ වැඩසටහන් - 2023

### *ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (1): විද්‍යාව හා තාක්ෂණය ගොඩනැගීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීම*

**01. ජාතික දේශීය වෛද්‍ය ප්‍රතිපත්තිය**

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය (BMARI) සමාලෝචනය කිරීමට පත්කළ සමාලෝචන මණ්ඩලය ජාතික දේශීය සෞඛ්‍ය හා ආයුර්වේද ප්‍රතිපත්තියක අවශ්‍යතාව නිර්දේශ කරන ලදී. මෙමගින් දේශීය වෛද්‍ය ක්‍රමයක් හෙවත් ආයුර්වේද ඖෂධවේදය දියුණු කිරීම සඳහා ප්‍රතිපාදන සැලසේ. කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්ති උපදේශන ක්‍රියාකාරකම් යටතේ මෙම ප්‍රතිපත්තිය සැකසීමට පහසුකම් සැලසූ අතර, ප්‍රතිපත්තිය අවසන් කර කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

**02. ජීනෝම (Genome ) මධ්‍යස්ථාන සහ ජාතික ජාන දත්ත ගබඩාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

කොමිෂන් සභාව විසින් 2018 දී කෙටුම්පත් කරන ලද ජීනෝම මධ්‍යස්ථාන සහ ජාතික ජානමය දත්ත ගබඩාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමේ කටයුත්ත නැවත ආරම්භ කරන ලදී. කෙටුම්පත පිළිබඳ මහජන මතය විමසා එම අදහස් විශේෂඥ උපදේශන සමඟ ප්‍රතිපත්තියට ඇතුළත් කර ඇති අතර, ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම සහ කොමිෂන් සභාව විසින් ඒකාබද්ධව යාවත්කාලීන කරන ලද ජාතික ජෛව තාක්‍ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය සමඟ මෙම කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත.

**03. ශ්‍රී ලංකාවේ ජාතික ඛනිජ ප්‍රතිපත්තිය (ප්‍රතිපත්ති උපදේශනය)**

පරිසර අමාත්‍යාංශය (MoE) විසින් ඉල්ලා ඇති පරිදි, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) ආකෘතියට අනුකූල වන පරිදි ප්‍රතිපත්ති කෙටුම්පත සංශෝධනය කරන ලදී. කොමිෂන් සභාව විසින් පරිසර අමාත්‍යාංශය සමඟ පාර්ශවකරුවන්ගේ රැස්වීමට ද පහසුකම් සලසන ලදී. පරිසර අමාත්‍යාංශය විසින් අවසන් පිටපත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

**04. පහත විෂයන්ට අදාළව හඳුනාගත් ප්‍රතිපත්ති නිර්දේශ මත සැකසූ තාක්ෂණික වාර්තා 4ක් පිළිබඳව තවදුරටත් පසු-ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළු (BICOST) ක්‍රියාකාරකම් ලෙස 2023දී සිදුකිරීම.**

a) දේශගුණික විපර්යාස, කෘෂිකර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාව
b) ශ්‍රී ලංකාවට ආවේණික ජෛව සම්පත්වලින් සැකසූ පෝෂණ ද්‍රව්‍ය සහ ප්‍රධාන ඖෂධීය සංයෝග
c) ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සහ ඛනිජ, අගය එක්කිරීම
d) පවිත්‍ර බලශක්තිය, හරිත හයිඩ්‍රජන් සහ බලශක්ති ගබඩාකරණය

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (2): ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම

පෙර වසරේ ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්‍ෂණ ක්‍රියාකාරකම් සමාලෝචනය කරමින් වාර්ෂිකව රජයට වාර්තාවක් ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවෙහි කාර්යභාරයක්ව ඇත. මානව සම්පත් සංවර්ධනය සඳහා වන ක්‍රියාමාර්ගවල සඵලතාවය, විද්‍යා හා තාක්ෂණ ආයතනවල ක්‍රියාකාරිත්වය, විද්‍යාව හා තාක්ෂණය සඳහා රාජ්‍ය වියදම්වල සඵලතාවය සහ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන විසින් විද්‍යාව හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ තක්සේරුවක් මෙම වාර්තාවට ඇතුළත් වේ. .

- **විද්‍යා හා තාක්ෂණ තත්ව වාර්තාව 2019-2020 සහ 2021**

2019 සහ 2020 සඳහා වන වාර්තා ප්‍රකාශයට පත් කර බෙදා හරින ලදී. 2021 සහ 2022 සඳහා දත්ත රැස් කිරීම ආරම්භ කරන ලදී.




*Science and Technology Status Reports 2019 & 2020*

*රූපය 3:විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව 2019 සහ 2020*

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (3): විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම

පනතේ 2 වන වගන්තියේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය කිරීමට කොමිෂන් සභාව හි කාර්යභාරයක්ව ඇත.

කොමිසමේ අනුමැතිය ඇතිව කොමිෂන් සභාව විසින් පත් කරන ලද අදාළ ක්ෂේත්‍ර වල ප්‍රවීණයන්ගෙන් සමන්විත බාහිර මණ්ඩල විසින් සමාලෝචන කටයුතු සිදුකරනු ලබන අතර, මෙම ආයතන විසින් සිදු කරනු ලබන විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය, පිරිවැය-ඵලදායීතාවය, අදාළත්වය සහ ඇගයීම සිදුකරයි. ඔවුන් ජාතික ප්‍රමුඛතා සහ ඉලක්ක සපුරා ගැනීමට අදාලව ඇගයීම සිදු කරයි. අදාළ

ආයතන විසින් ඉදිරිපත් කරන ලද ස්වයං තක්සේරු වාර්තාව සහ සමාලෝචන අත්පොත මත පදනම්ව සමාලෝචනය සිදු කෙරේ. අමතර තොරතුරු පාර්ශවකරුවන්ගේ උපදේශන වලින් එකතු කරනු ලැබේ.

සමාලෝචන ක්‍රියාවලියට සුවිශේෂී අදියර හතරක් ඇත.

- සමාලෝචනය සඳහා සූදානම් වීම
- සමාලෝචන කණ්ඩායම ආයතනයන් වෙත යාම.
- සමාලෝචන කණ්ඩායම විසින් කෙටුම්පත් වාර්තාව සකස් කිරීම
- සමාලෝචන කණ්ඩායම විසින් සමාලෝචන වාර්තාවෙහි නිරවද්‍යතාවය තහවුරු කර අවසන් වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

09 වැනි ද්විවාර්ෂික සමුළුව (BICOST IX) සමුළුවට සමගාමීව, සමුළුව සඳහා වූ කොමිෂන් සභා අනුකමිටුවක් මඟින් පසුගිය වසර පහක් තුළ (2017-2021) කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලද හොඳම ක්‍රියාකාරී ආයතන සඳහා සම්මාන දෙකක් පිරිනැමීමට තීරණය කරන ලදී. විවිධ අමාත්‍යාංශ යටතේ පවතින ආයතන මෙන්ම කොමිෂන් සභාවට අයත් අමාත්‍යාංශයේම ආයතන තිබූ බැවින්, මෙම කර්තව්‍යය අපක්ෂපාතීව සහ විනිවිදභාවයෙන් සිදු කිරීම සඳහා, ශ්‍රී ලංකා ඇගයුම්කරුවන්ගේ සංගමය ස්වේච්ඡා පදනමින් කොමිෂන් සභාව සමඟ ස්වාධීන පාර්ශවයක් ලෙස කටයුතු කරන ලදී. කොමිෂන් සභාව කාර්යසාධන සමාලෝචන වාර්තා 13ක් සම්පූර්ණයෙන් ඇගයීමෙන් පසුව, ජාතික විද්‍යා පදනම සහ කාර්මික තාක්ෂණ ආයතනය මෙම සමුළුවේදී හොඳම කාර්ය සාධනයක් සහිත ආයතන ලෙස සම්මාන ලැබීය.




*රූපය 4:ජා.වි.හා තා.කො.ස. සමාලෝචන වාර්තා නිල වශයෙන් ගරු අමාත්‍යතුමාට පිළිගැන්වීම*

2023 දී, කොමිෂන් සභාව විසින් 2019 සහ 2022 අතර සිදු කරන ලද කාර්ය සාධන සමාලෝචන වාර්තා හයක් නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ආයතනවල ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම කොමිෂන් සභාව වෙත පැවරී ඇතත්, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අදහස් මත පදනම්ව සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සිදු කිරීමට 2023 දී තීරණය කරන ලදී. පළමු පියවර ලෙස, කොමිෂන් සභාව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය, විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ අදාළ 2020-2022 අතර සමාලෝචනය කරන ලද ආයතන ප්‍රධානීන් ඇතුළු ප්‍රධාන රාජ්‍ය ආයතන සමඟ මැයි 4 වන දින කොමිෂන් සභාව විසින් රැස්වීමක් පැවැත්වීය.

මෙම අවස්ථාවෙහිදී, එක් එක් සමාලෝචන මණ්ඩලයේ සභාපතිවරු එම ක්‍රියාකාරකම් සිදු කිරීමේ වැදගත්කම අවධාරණය කරමින් සමාලෝචනයේ ප්‍රධාන සොයාගැනීම් සහ යෝජිත නිර්දේශ ඉදිරිපත් කළහ. මෙම රැස්වීමේදී, ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය තක්සේරු කිරීමට සහ ක්‍රියාවලියේදී මතු වූ ගැටළු

සාකච්ඡා කිරීමට ආයතන සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ තවත් රැස්වීමක් පැවැත්වීමට කොමිෂන් සභාව තීරණය කරණ ලදී.

සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා, විද්වත් සාකච්ඡාවක් 2023 සැප්තැම්බර් 6 වැනි දින, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ බාධක හඳුනා ගැනීමට සහ සහයෝගීතා විසඳුම් ලබා දීමට මෙන්ම ජාතික මට්ටමේ ප්‍රතිපත්ති තීරණ ලබා ගැනීමට, විශේෂයෙන් ජාතික අයවැයෙන් අරමුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් බහුවිධ ප්‍රවේශයක් මෙම සාකච්ඡාවේදී සලකා බලන ලදී.

2023 දී කොමිෂන් සභාව විසින් ආයතන 03 ක් සමාලෝචනය කිරීමට ආරම්භ කරන ලදී.

1. ජාතික පොහොර ලේකම් කාර්යාලය (NFS)

2. ජාතික පර්යේෂණ සභාව (NRC)

3. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)

**ජාතික පොහොර ලේකම් කාර්යාලය (NFS)**

ජාතික පොහොර ලේකම් කාර්යාලය, 1988 අංක 68 දරන පොහොර නියාමන පනත යටතේ පිහිටුවන ලද අතර දැනට කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතී. කොමිෂන් සභාව විසින් 2023 ඔක්තෝම්බර් මාසයේදී ජාතික පොහොර ලේකම් කාර්යාලයේ සමාලෝචනය ආරම්භ කරන ලද අතර, සමාලෝචනය සඳහා පහත සඳහන් මණ්ඩල සාමාජිකයින් පත් කර ඇත.

1. මහාචාර්ය බුද්ධි මාරඹේ (සභාපති)

2. ආචාර්ය ජිනාදරි ද සොයිසා

3. ආචාර්ය සරත් අබේසිංහ

ආයතනයට පැමිණීමට පෙර කමිටුව මූලික සාකච්ඡාවක් සඳහා නොවැම්බර් 16 වැනි දින කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා හමුවිය. එදිනම, කමිටුව විසින් ආයතනයේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය හමුවිය. මණ්ඩලය 2024 පළමු කාර්තුව වන විට සමාලෝචනය අවසන් කිරීමට නියමිතය.

**ජාතික පර්යේෂණ සභාව (NRC)**

ජාතික පර්යේෂණ සභාව යනු ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්‍ෂණය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා අරමුදල් සපයන ප්‍රමුඛ නියෝජිතායතනය ලෙස, ජාතික සංවර්ධනයට දායක වන පර්යේෂණ සඳහා පහසුකම් සපයන අතර, සහ පර්යේෂණයන්හි විශිෂ්ටත්වය සඳහා විද්‍යාඥයින් ඇගයීමට ලක් කරයි.

මෙම සමාලෝචනය ද 2023 ඔක්තෝම්බර් මාසයේදී විශේෂඥ මණ්ඩලයක් සමඟින් ආරම්භ විය.

1. ආචාර්ය සුනිල් අබේරත්න (සභාපති)

2. මහාචාර්ය එච්.එම්.ටී.එන්.ආර්.හේරත්

3. ආචාර්ය එම්.සී.එම්.ඉක්බාල්

ජාතික පර්යේෂණ සභාව විසින් වර්ෂයේ අවසන් කාර්තුවේ පවත්වන ජනාධිපති සම්මාන උළෙල සඳහා වූ කාර්ය බහුලත්වය නිසා කරන ලද විශේෂ ඉල්ලීම මත මෙම ක්‍රියාවලිය 2024 ජනවාරි මස දක්වා කල් දැමීමට සිදු විය. කෙසේ වෙතත්, සමාලෝචන මණ්ඩලය මාර්ගගත රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)**

අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව (SLIC), දේශීය නව නිපැයුම්කරුවන් සඳහා නව්‍ය අදහස් පෝෂණය කිරීමේ සිට ක්‍රමානුකූලව ප්‍රායෝගික මට්ටම දක්වා ඒවා සංවර්ධනය කිරීම, ජාතික ආර්ථිකයට දායකවන වාණිජමය පරිමාණයේ නිෂ්පාදන වශයෙන් අවසන් කිරීම දක්වා තාක්ෂණික, නීතිමය සහ මූල්‍ය ආධාර සැපයීම සිදු කරනු ලැබේ.

කොමිෂන් සභාව විසින් මෙම සමාලෝචනය 2023 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර, මේ සඳහා පහත සඳහන් මණ්ඩල සාමාජිකයින් පත් කරන ලදී:

1. එම්.සී. රාජපක්ෂ මහත්මිය (සභාපති)

2. මහාචාර්ය නිශාන්ත සම්පත් පුංචිහේවා

3. මහාචාර්ය තනුජා චාන්දනී සන්දනායක

කමිටුව දෙසැම්බර් 4 සහ 5 යන දිනවල ආයතනයේ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය ද හමු විය. සමාලෝචන ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින්, නව නිපැයුම්කරුවන් සමඟ පාර්ශවකරුවන්ගේ රැස්වීමක් 2024 දෙසැම්බර් 13 වන දින, මෙම ආයතන පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම අවස්ථාවට නව නිපැයුම්කරුවන් 25 කට වැඩි පිරිසක් සහභාගී විය.

## *ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (4): විද්‍යා හා තාක්ෂණ ආයතනයනට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ රජයට උපදෙස් ලබාදීමට ප්‍රථම අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතන විමසීම*

ප්‍රතිපත්තිමය පුරප්පාඩු සහ අවශ්‍යතා හඳුනා ගැනීමට විද්‍යාඥයන්, ඉංජිනේරුවන් සහ පර්යේෂකයන් පෙළ ගැස්වීම.

**01. තරුණ විද්‍යාඥයින්ගේ සංසදය (YSF)**

ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයින්ගේ සංසදය (YSF) සඳහා 2000 වසරේ සිට කොමිෂන් සභාව විසින් අනුග්‍රාහකත්වය සපයනු ලබන්නේ ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයින්ට ජාලගතකරණය සඳහා අවකාශයක් නිර්මාණය කරන අතරම දැනුම හුවමාරු කර ගැනීම සඳහා වේදිකාවක් නිර්මාණය කිරීමට අවස්ථාවක් ලබා දීම සඳහාය. තරුණ විද්‍යාඥයින්ගේ සංසදය දැනට විවිධ විෂය ක්ෂේත්‍රවල සාමාජිකයින් 400කට වඩා වැඩි ගණනකින් සමන්විත වේ.

***<u>I. තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ (YSF) මෙහෙයුම් කමිටුව</u>***

තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ මෙහෙයුම් කමිටු සාමාජිකයින් 13 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙහෙයුම් කමිටුව සභාපතිවරයෙකු විසින් මෙහෙයවනු ලබන අතර ඔහුට සම ලේකම්වරුන් දෙදෙනෙකුගේ සහාය ලැබේ. සෑම වසරකම, වාර්ෂික මහා සභා රැස්වීමේදී නව මෙහෙයුම් කමිටුවක් තෝරා පත් කර ගනු ලැබේ. 2023 මෙහෙයුම් කමිටුව 2023 ජනවාරි 27 වැනි දින මාර්ගගත ක්‍රමයට පැවති වාර්ෂික මහා සභා රැස්වීම අතරතුරදී තේරී පත් විය.

## ***II. තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය***

2012 දී ආරම්භ කරන ලද තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ පර්යේෂණ සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණ තරුණ විද්‍යාඥයින්ට විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ සොයාගැනීම් සහ පර්යේෂණ අවශ්‍යතා බෙදා හදා ගනිමින් සහයෝගිතා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමට වේදිකාවක් සැපයීම වන අතර මෙම සම්මන්ත්‍රණය ජාලගතකරණය සහ තාක්ෂණ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා අවකාශයක් නිර්මාණය කරන ජනප්‍රිය වැඩසටහනක් බවට පත්වී ඇත.

කොමිෂන් සභාව විසින් එහි 11 වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය 2023 ජනවාරි 27 වන දින මාර්ගගත ක්‍රමවේදය හරහා පැවැත්වීමට සැලසුම් කරණ ලදී. දීර්ඝ සාරාංශ පර්යේෂණ පත්‍රිකා සහ සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා යන දෙකම පිළිගනු ලැබීය. පර්යේෂණ පත්‍රිකා සඳහා වූ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුවේ (NRDF) හඳුනාගෙන ඇති අවධානය යොමු කළ ක්ෂේත්‍ර 10 වන සෞඛ්‍ය; ආහාර, පෝෂණය සහ කෘෂිකර්මය; පරිසරය; ජලය; බලශක්ති; නිවාස; ඛනිජ සම්පත්; තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ දැනුම සේවා; සහ මූලික විද්‍යාවන්, නැගී එන තාක්ෂණයන් සහ දේශීය දැනුම අදාළව දීර්ඝ සාරාංශ පත්‍රිකා 41 කින් සහ සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා 19 කින් සමන්විත පර්යේෂණ පත්‍රිකා 60ක් කොමිෂන් සභාව වෙත ලැබුණි. සෑම පර්යේෂණ පත්‍රයක්ම ද්විත්ව සමාලෝචන ක්‍රියාවලියක් මත ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් දෙදෙනෙකු විසින් ඇගයීමට ලක් කරන ලද අතර, දීර්ඝ සාරාංශ 36 සහ සම්පූර්ණ පත්‍රිකා 17 ඇතුළුව පත්‍රිකා 53 ක් මාර්ගගත වේදිකාව හරහා සම්මන්ත්‍රණයට ඉදිරිපත් කිරීමට තෝරා ගන්නා ලදී. තෝරාගත් පත්‍රිකා සම්මන්ත්‍රණයේදී විද්‍යුත් මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම සම්මන්ත්‍රණයේ සමාරම්භක උත්සවයේ ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය උදිත් කේ. ජයසිංහ-මුදලිගේ මහතා අදහස් දැක්වූ අතර, මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ මහාචාර්ය රංගික හල්වතුර මහතා ප්‍රධාන විද්වත් දේශනය ඉදිරිපත් කරන ලදී.

2023 වර්ෂයේ අවසාන කාලය තුළ, තරුණ විද්‍යාඥයින්ගේ සංසදය විසින් 12 වැනි තරුණ විද්‍යාඥයින්ගේ පර්යේෂණ සම්මන්ත්රණය 2024 ජනවාරි මස පැවැත්වීමට සැලසුම් කරන ලදී. තරුණ විද්‍යාඥයින්ගේ සංසදය විසින් දීර්ඝ සාරාංශ පත්‍රිකා සහ සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා යන දෙකම ඉල්ලා සිටි අතර දීර්ඝ සාරාංශ 47 සහ සම්පූර්ණ පත්‍රිකා 25 කින් සමන්විත පර්යේෂණ පත්‍රිකා 72ක් ලැබුණි.

මෙම පර්යේෂණ පත්‍රිකා අංශ හතක් යටතේ ලැබී තිබුණි. (1) ඉංජිනේරු, විද්‍යාව සහ තාක්‍ෂණයේ දියුණුව; (2) ආර්ථික, මූල්‍ය සහ කළමනාකරණය; (3) බලශක්ති, පරිසරය සහ ස්වභාවික සම්පත්; (4) ආහාර, පෝෂණය සහ කෘෂිකර්මය; (5) පරිගණක හා තොරතුරු විද්‍යාවේ නව්‍යතාවයන් (6) ඉගැන්වීමේ සහ ඉගෙනීමේ නවෝත්පාදන; සහ (7) නවීන සෞඛ්‍ය සේවා සහ දේශීය වෛද්‍ය පිළිවෙත්.

සෑම පත්‍රිකාවක්ම ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් දෙදෙනෙකු විසින් ද්විත්ව සමාලෝචන ක්‍රියාවලියක් මත ඇගයීමට ලක් කරන ලද අතර, 2024 ජනවාරි මාසයේදී මාර්ගගත වේදිකාවක් හරහා සම්මන්ත්‍රණයට ඉදිරිපත් කිරීමට දීර්ඝ සාරාංශ 38 සහ සම්පූර්ණ පත්‍රිකා 15 ඇතුළු පත්‍රිකා 53ක් තෝරා ගන්නා ලදී.

## ***III. රටේ ජාතික ප්‍රමුඛතා සහ ගැටලු පිළිබඳව දැනුවත් කිරීමේ මාර්ගගත සම්මන්ත්‍රණ මාලාව***

තරුණ විද්‍යාඥයින්ගේ සංසදය විසින් 2023 සඳහා තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ ක්‍රියාකාරකම් සැලැස්මේ කොටසක් ලෙස මාර්ගගත සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණ වල ප්‍රධාන අරමුණ වන්නේ රටේ වත්මන් සහ නැගී එන විද්‍යාත්මක කටයුතු පිළිබඳව තරුණ විද්‍යාඥයින් අතර දැනුම්වත් කිරීම සහ දැනුම බෙදා හැරීමයි. ඉහත අරමුණ මත පදනම්ව, 2023 වර්ෂය තුළ දැනුම්වත් කිරීමේ සම්මන්ත්‍රණ 4 ක් සංවිධානය කරන ලදී.

## 1.'පරිසරයේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් නිස්සාරණය සහ හඳුනාගැනීමේ ශිල්පීය ක්‍රම' පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය


ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ (NASTEC) තරුණ විද්‍යාඥයින්ගේ සංසදය (YSF) විසින් 2023 වසරේ අඛණ්ඩව තුන්වන වසරටත් සංවිධානය කරන ලද මාර්ගගත දැනුම බෙදාගැනීමේ සැසි මාලාවක පළමු සැසිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ පරිසර ප්‍රතිරෝධීතා පර්යේෂණ මධ්‍යස්ථානයේ සහයෝගීතාවයෙන් 2023 ජූනි 21 වන දින පවත්වන ලදී. 'පරිසරයේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් නිස්සාරණය සහ හඳුනාගැනීමේ ශිල්පීය ක්‍රම' පිළිබඳව මෙම සම්මන්ත්‍රණයේ අවධානය යොමු වූ අතර, පරිසරයේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් පැවතීම, ප්‍රතිපල සහ හඳුනාගැනීමේ ක්‍රම පිළිබඳ දළ විශ්ලේෂණයක් සහභාගිවන්නන්ට ලබා දෙමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ පරිසර ප්‍රතිරෝධීතා පර්යේෂණ මධ්‍යස්ථානයේ මහාචාර්ය මෙත්තිකා විතානගේ ආරාධිත කථිකයා ලෙස ප්‍රේක්ෂකයින් ඇමතීය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අනුෂ්කා රාජපක්ෂ විසින් සැසියේ සම්බන්ධීකරණය සිදු කරන ලදී. ප්‍රශ්නෝත්තර සැසියකින් පසු සම්මන්ත්‍රණය සාර්ථකව අවසන් වූ අතර 100 කට අධික පිරිසක් සැසියට එක් විය.




*රූපය 5: පරිසරගෝලයේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය*

## 2. තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය: ජානවල සිට ජීනෝම්ය දක්වා: ශාක ව්‍යාධිජනක දිලීර අධ්‍යයනය කිරීම සඳහා DNA අනුක්‍රම දත්ත භාවිතා කිරීමේ දියුණුව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ (NASTEC) තරුණ විද්‍යාඥයින්ගේ සංසදය (YSF) විසින් 2023 වසරේ අඛණ්ඩව තෙවන වසර සඳහා සංවිධානය කරන ලද මාර්ගගත දැනුම බෙදාගැනීමේ සැසි මාලාවක 2 වැනි සම්මන්ත්‍රණය 2023 සැප්තැම්බර් 30 වැනි දින පැවැත්විණි. ශාක ව්‍යාධිජනක දිලීර අධ්‍යයනය කිරීම සඳහා DNA අනුක්‍රමික දත්ත භාවිතා කිරීමේ දියුණුව පිළිබඳ දළ විශ්ලේෂණයක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශයේ ප්‍රධානී ආචාර්ය ධනුෂ්ක උදයංග ආරාධිත කථිකයා සහ සම්පත් දායකයා ලෙස සහභාගිවන්නන්ට ලබා දුන්නේය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශයේ ආචාර්ය සුමුදු මාපා මහත්මිය සැසියේ සම්බන්ධීකරණය සිදුකරන ලදී. ප්‍රශ්නෝත්තර සැසියකින් පසු සම්මන්ත්‍රණය සාර්ථකව අවසන් වූ අතර 35කට වැඩි පිරිසක් සැසියට එක් විය.




*රූපය 6: ශාක ව්‍යාධිජනක දිලීර අධ්‍යයනය කිරීම සඳහා DNA අනුක්‍රමික දත්ත භාවිතා කිරීමේ දියුණුව පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය*

## 3. තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය: සාර්ථක විශ්ව විද්‍යාල අයදුම්පතක් පිළියෙල කරන්නේ කෙසේද?

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥයින්ගේ සංසදය (YSF) විසින් 2023 වසරේ අඛණ්ඩව තෙවැනි වරටත් සංවිධානය කරන ලද මාර්ගගත දැනුම බෙදාගැනීමේ සැසි මාලාවක 3 වැනි සම්මන්ත්‍රණය 2023 නොවැම්බර් 15 වැනි දින පැවැත්විණි. සාර්ථක විශ්ව විද්‍යාල අයදුම්පතක් සකසන ආකාරය සහ විශ්වවිද්‍යාල අයදුම්පත්‍රයක ප්‍රධාන අංග පිළිබඳව කැනඩාවේ ඩල්හවුසි විශ්ව විද්‍යාලයේ ජීව විද්‍යා අංශයේ මහාචාර්යවරියක් වන මහාචාර්ය අරුණිකා ගුණවර්ධන ආරාධිත කථිකයා සහ සම්පත් දායකයා ලෙස දළ විශ්ලේෂණයක් සහභාගිවන්නන්ට ලබා දෙන ලදී. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ඒකාබද්ධ උසස් පර්යේෂණ හා අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අංචලා අයි. කුරුප්පු මහත්මිය සැසිය සම්බන්ධීකරණය කරන ලදි. ප්‍රශ්නෝත්තර සැසියකින් පසු සම්මන්ත්‍රණය සාර්ථකව අවසන් වූ අතර 65 කට අධික පිරිසක් සැසියට එක් විය.




*රූපය 7: සාර්ථක විශ්ව විද්‍යාල* අයදුම්පතක් පිළියෙළ කරන ආකාරය පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය

**4. තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය: ශාස්ත්‍රීය ප්‍රකාශන සඳහා පැතිකඩක් (**'The *Academic Publishing Landscape)*

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥයින්ගේ සංසදය (YSF) විසින් 2023 වසරේ අඛණ්ඩව තුන්වන වසරටත් සංවිධානය කරන ලද මාර්ගගත ක්‍රමවේදය හරහා දැනුම බෙදාගැනීමේ සැසි මාලාවක 4 වැනි සම්මන්ත්‍රණය 2023 දෙසැම්බර් 16 වැනි දින පැවැත්විණි. ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨයේ නැනෝ විද්‍යා තාක්ෂණ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය රොෂාන් තොටගමුගේ ආරාධිත කථිකයා සහ සම්පත් දායකයා ලෙස ප්‍රේක්ෂකයින් අමතා ශාස්ත්‍රීය ප්‍රකාශන සඳහා පැතිකඩක් පිළිබඳ සැසියක් පැවැත්වීය. ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨයේ නැනෝ විද්‍යා තාක්ෂණ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ මෙහෙයුම් කමිටු සාමාජික ආචාර්ය උපනිත් එස් ලියනආරච්චි මහතා සැසිය සම්බන්ධීකරණය කළේය. ප්‍රශ්නෝත්තර සැසියකින් පසු සම්මන්ත්‍රණය සාර්ථකව අවසන් වූ අතර 70ක් පමණ පිරිසක් සැසියට එක් විය.




*රූපය 8: ශාස්ත්‍රීය ප්‍රකාශන පැතිකඩ පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණය*

## ***<u>IV. තරුණ විද්‍යාඥයින් සඳහා නිපුණතා සංවර්ධන වැඩමුළු</u>***

තරුණ විද්‍යාඥයින්ගේ විවිධ ක්ෂේත්‍රවල ධාරිතාව සහ කුසලතා ගොඩනැගීමට උපකාර කිරීම සඳහා වසර පුරාවටම තරුණ විද්‍යාඥයින්ගේ සංසදය විසින් කුසලතා සංවර්ධන මාර්ගගත වැඩමුළු මාලාවක් සැලසුම් කරන ලදි.

### 1. ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය: අභියෝග සහ අවස්ථා පිළිබඳ වැඩමුළුව

තරුණ විද්‍යාඥයින්ගේ සංසදය විසින් සංවිධානය කරන ලද මාර්ගගත වැඩමුළු මාලාවක 1 වන නිපුණතා සංවර්ධන වැඩමුළුව 2023 අගෝස්තු 26 වන දින ස්වභාවික සම්පත් අධ්‍යයන සංගමය (SNRS), සබරගමුව විශ්ව විද්‍යාලයේ ස්වභාවික සම්පත් දෙපාර්තමේන්තුව සහ රත්නපුර මැණික් හා හරිතාගාර සංගමය (RGGA) සමඟ එකතුව සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුවේදී 'ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය: අභියෝග සහ අවස්ථා' පිළිබඳව අවධානය යොමු කරන ලද අතර, මහාචාර්ය පී.ජී.ආර්. ධර්මරත්න, මොරටුව විශ්වවිද්‍යාලය; එන්.පී. සමරතුංග. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජාතික බලාත්මක කිරීම සහ ප්‍රාදේශීය සංවර්ධන), ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය; සහ පුන්සිරි තෙන්නකෝන් මහතා, පුන්සිරි ජෙම්ස් විසින් සබරගමුව විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී 200 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් වැඩමුළුව පවත්වන ලදී. සබරගමුව විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ස්වභාවික සම්පත් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය හසින්ත විජේසේකර මහතා වැඩමුළුව මෙහෙයවන ලදී.





*රූපය 9: ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ වැඩමුළුව*

## ***V. රටේ ජාතික ප්‍රමුඛතා සහ ගැටලු පිළිබඳ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ ප්‍රකාශන මාලාව***

තරුණ විද්‍යාඥයින්ගේ සංසදය විසින් 2021 දී එහි ප්‍රධාන ක්‍රියාකාරකම් වලින් එකක් ලෙස පරිච්ඡේද විද්‍යුත් ග්‍රන්ථයක් (Chapter E Book) ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර එය 2023 දක්වා වාර්ෂිකව අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම විද්‍යුත් ග්‍රන්ථයේ ප්‍රධාන අරමුණ වන්නේ හඳුනාගත් මාතෘකාවක් පිළිබඳව ඇති තොරතුරු පිළිබඳ පුළුල් සමාලෝචනයක් සැපයීම සහ ප්‍රතිපත්තිමය කරුණු හඳුනාගැනීමයි. සමාලෝචනය මත පදනම්ව, තරුණ විද්‍යාඥයින්ට ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ කොටස්කරුවන් වීමට අවකාශයක් නිර්මාණය කරන අතරම, ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලීන් සඳහා විද්‍යාත්මක අංශ ඇතුළත් කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම/මැදිහත්වීම් සහ නව ප්‍රතිපත්ති ක්ෂේත්‍ර සඳහා නිර්දේශ ලබාදෙනු ලැබේ.

දෙවන විද්‍යුත් ග්‍රන්ථයේ මාතෘකාව “ශ්‍රී ලංකාවේ අර්බුද හමුවේ ආර්ථික පරිවර්තනය කඩිනම් කිරීම සඳහා බහුආංශික ප්‍රවේශයන්” වන අතර ඉහත මාතෘකාව යටතේ විවිධ පොත් පරිච්ඡේද 16 ක් තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සාමාජිකයින්ගෙන් ලැබී ඇති අතර එය විද්‍යුත් ග්‍රන්ථයක් ලෙස සම්පූර්ණ සමාලෝචන ක්‍රියාවලියකින් පසු සම්පාදනය කරන ලදී. 2023 ජනවාරි 27 වන දින පැවති 11 වන තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණයේදී ISBN අංකයක් සහිත, විද්‍යුත් ග්‍රන්ථය එළිදක්වන ලදී.




*රූපය 10: YSF තේමාත්මක විද්‍යුත් ප්‍රකාශනය - ආර්ථික පරිවර්තනය වේගවත් කිරීම සඳහා බහුආංශික ප්‍රවේශයන්*

1 වන සහ 2 වන තේමාත්මක විද්‍යුත් පොත් සාර්ථක ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, තරුණ විද්‍යාඥයින්ගේ සංසදය විසින් "දේශගුණික විපර්යාස, බලපෑම්, අවදානම්, අවම කිරීම සහ අනුවර්තනයන්: ශ්‍රී ලාංකේය ඉදිරි දර්ශනය" යන මාතෘකාව යටතේ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ 3 වන තේමා

ප්‍රකාශනය සඳහා පොත් පරිච්ඡේද ඉල්ලා සිටින ලදී. සම්පාදනය කරන ලද එම ප්‍රකාශනය 2024 දී තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ සම්මන්ත්‍රණයේදී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

## ***VI. තරුණ විද්‍යාඥ සම්මානය***

සෑම වසරකම තරුණ විද්‍යාඥයින්ගේ සංසදයෙන් තෝරාගත් විශිෂ්ට තරුණ විද්‍යාඥයෙකුට කොමිෂන් සභාව විසින් තරුණ විද්‍යාඥ සම්මානය පිරිනමයි. කොමිෂන් සභාව විසින් පත් කරන ලද අනු කමිටුවේ තීරණවලට අනුව, තරුණ විද්‍යාඥ සම්මානය "පර්යේෂණ සඳහා තරුණ විද්‍යාඥ සම්මානය" සහ "තාක්‍ෂණය සඳහා තරුණ විද්‍යාඥ සම්මානය" යන කාණ්ඩ දෙකක් යටතේ පිරිනැමීමට 2021 වර්ෂයේ සිට තීරණය කරන ලදී. මෙම ක්‍රියාවලිය සඳහා, සම්මාන දෙකක් සඳහා තේරීම් නිර්ණායක සලකුණු කිරීමේ යෝජනා ක්‍රම සංශෝධනය කර අවසන් කිරීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයින්ගෙන් සම්මාන සඳහා අයදුම්පත් කැඳවන ලදී. 2022 වන විට සම්පූර්ණ අයදුම්පත් 42 ක් ලැබී තිබුන අතර, එය සුදුසුකම් අනුව කෙටි ලැයිස්තුගත කර, කොමිෂන් සභාව විසින් පත් කරන ලද විද්වත් මණ්ඩලයක් විසින් ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම් මත පදනම්ව සෑම කාණ්ඩයකම සම්මානලාභියෙකු තෝරා ගන්නා ලදී. පහත සඳහන් සම්මානලාභීන් සඳහා 2023 මාර්තු 24 වන දින පැවති 09 වැනි ද්විවාර්ෂික සමුළුව සම්මන්ත්‍රණයේදී තරුණ විද්‍යාඥ සම්මාන දෙකක් පිරිනමන ලදී.

- පර්යේෂණ සඳහා තරුණ විද්‍යාඥ සම්මානය - මහාචාර්ය පී.ඒ.ඩී.එච්.එන්. ගුණතිලක
- තාක්‍ෂණය සඳහා තරුණ විද්‍යා සම්මානය - ආචාර්ය ඉමල්කා මුණවීර




*රූපය 11: YSF තේමාත්මක විද්‍යුත් ප්‍රකාශනය - ආර්ථික පරිවර්තනය වේගවත් කිරීම සඳහා බහුආංශික ප්‍රවේශයන්*

## *ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (5): විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ද්විවාර්ෂික සමුළුව (BICOST) කැඳවීම*

විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 2 වන වගන්තියේ දක්වා ඇති අරමුණු ආමන්ත්‍රණය කිරීම සඳහා ජාතික මට්ටමින් විද්‍යා හා තාක්ෂණ කරුණු සාකච්ඡා කිරීමට මෙම සමුළුව වේදිකාවක් සපයයි.

මෙම විෂය පථය තුළ, 09 වැනි ද්විවාර්ෂික සමුළුව මාර්තු 23 සහ 24 යන දිනවල වෝටර්ස් එජ් හෝටලයේදී ගරු අධ්‍යාපන ඇමතිතුමන්ගේ අනුග්‍රහයෙන් පැවැත්වුණි. "දේශගුණික විපර්යාස හමුවේ තිරසාර සංවර්ධනය සඳහා විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදන" සමුළුවේ තේමාව විය. සම්මන්ත්‍රණයේ පළමු දිනයේ ප්‍රධාන ආරාධිතයා ලෙස ඉන්දීය මහ කොමසාරිස්තුමා සහභාගී වූ අතර, දෙවන දිනයේ ඇමරිකා එක්සත් ජනපද තානාපතිතුමිය සහභාගී විය. මෙම අවස්ථාවට උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයාද සහභාගී විය.

ශාස්ත්‍රීය, කර්මාන්ත, පරිපාලනය, රාජ්‍ය තාන්ත්‍රික සහ ප්‍රතිපත්ති අංශ නියෝජනය කරමින් මෙම දෙදින සමුළුවට ප්‍රවීණයන් 300කට වැඩි පිරිසක් සහභාගි වූහ.සම්මන්ත්‍රණය අවසානයේ ප්‍රතිපත්ති නිර්දේශ හතරක් ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන ලදී.






*රූපය 12: දසවන ද්විවාර්ෂික සමුළුවේ තාක්ෂණික නිමැවුම් වාර්තා*

## ජාත්‍යන්තර කටයුතු

### *බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු-ආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා එකමුතුව (BIMSTEC)*

•බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු-ආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා එකමුතුව (BIMSTEC) සඳහා විද්‍යා හා තාක්ෂණය පිළිබඳ පළමු විද්වත් හමුව විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව 2023 ජූනි 21 දින පවත්වන ලදී. කලාපය පුරා විශේෂඥයින් 60 කට වැඩි පිරිසක් සහභාගී වූ අතර, ආංශික කටයුතු සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුමත කරන ලදී.




*රූපය 13: බිම්ස්ටෙක් සඳහා S&T පිළිබඳ පළමු විශේෂඥ රැස්වීම*

• බිම්ස්ටෙක් (BIMSTEC) යටතේ හිමාලයානු විද්‍යා කවුන්සිලයේ දෙවන විශේෂඥ රැස්වීම 2023 ජූලි 26 වැනි දින පවත්වන ලදී. විශේෂයෙන් දේශගුණික විපර්යාස ප්‍රතිවිපාක සඳහා දේශසීමාවෙන් ඔබ්බට විද්‍යා ප්‍රතිපත්ති විෂය පථය තුළ කලාපීය ගැටලු විසඳීම සඳහා බිම්ස්ටෙක් සාමාජික රටවලින් 45 සහභාගි වූහ.




*රූපය 14: බිම්ස්ටෙක් හිමාලයානු විද්‍යා කවුන්සිලයේ දෙවන විශේෂඥ රැස්වීම*

## *නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T මධ්‍යස්ථානය)*

නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Center, www.namstct.org), 1989 අගෝස්තු මාසයේ සිට ඉන්දියාවේ පිහිටා ඇති අන්තර්-රාජ්‍ය සංවිධානයක් ලෙස විද්‍යා හා තාක්ෂණය සම්බන්ධව දකුණු-දකුණු සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමේදී ඉතා ක්‍රියාකාරීව කටයුතු කරයි. ලතින් ඇමෙරිකානු, අප්‍රිකානු, ආසියා සහ යුරෝපීය මහද්වීපවල පැතිරී ඇති මධ්‍යස්ථානයේ සාමාජික රටවල් 47න් ශ්‍රී ලංකාව එකකි. අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ විද්‍යාඥයින්, තාක්ෂණවේදීන් සහ විද්‍යාත්මක සංවිධාන අතර අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සමඟ සහයෝගීතා පැවැත්වීමේ හැකියාව එමගින් සපයයි. කොමිෂන් සභාව, ශ්‍රී ලංකාව සඳහා නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරයි.
මේ වන විට, නාම් විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාවේ පවත්වන ලද එවැනි ජාත්‍යන්තර වැඩසටහන් හතක් ඇතුළුව විද්‍යාත්මක හා තාක්ෂණික මාතෘකා රාශියක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර වැඩමුළු 91 ක් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල පුහුණු පාඨමාලා 45 ක් පමණ සංවිධානය කර ඇත. මෙම ක්‍රියාකාරකම් හරහා ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින් විශාල සංඛ්‍යාවක් ඇතුළුව ලොව පුරා සිටින පර්යේෂකයන් සහ වෘත්තිකයන් විශාල පිරිසකට ප්‍රතිලාභ ලබා දී ඇත.

**නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 16 වන පාලක සභා රැස්වීම**

නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ (NAM S&T මධ්‍යස්ථානය) 16 වැනි පාලක සභා රැස්වීම 2023 ජූලි 27-28 දිනවල මොරිෂස් රාජ්‍යයේ අධ්‍යාපන, තෘතීයික අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය විසින් පවත්වන ලදී (MoETEST). මොරිෂස් හි විවිධ අමාත්‍යාංශ සහ විද්‍යාත්මක ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු රටවල් 12 ක නියෝජිතයින් 44 ක් සහ නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථාන ලේකම් කාර්යාලයේ නියෝජිතයින් මෙම රැස්වීමට සහභාගී වූහ.

ආරම්භක සැසිවාරයෙන් පසුව, 16 වන පාලක සභාවෙහි ක්‍රියාකාරී මට්ටමේ රැස්වීම ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15 වන පාලක සභා සභාපති එම්. එන්. රණසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් නියෝජිතයින් හඳුන්වාදීමත් සමඟ ආරම්භ විය. 16 වන පාලක සභාව සඳහා නව නිලධාරී මණ්ඩලය පහත පරිදි තේරී පත් විය; සභාපති: මොරිෂස්, උප සභාපතිවරු: ඊජිප්තුව, පලස්තීනය, දකුණු අප්‍රිකාව. කොමිෂන් සභාව හි වැඩබලන අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ජනක එස්. ගීකියනගේ මහතාද අන්තර්ජාලය හරහා මෙම රැස්වීමට සහභාගී විය. කෘත්‍යාධිකාරී මණ්ඩලය 2021 පෙබරවාරි 24 වැනි දින පැවති 15 වන පාලක සභා රැස්වීමේ සිට මධ්‍යස්ථානයේ විද්‍යාත්මක ක්‍රියාකාරකම් සමාලෝචනය කළ අතර යෝජිත නව මූල පිරිම් සහ විද්‍යාත්මක ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා කරන ලදී.



Inauguration of 16th Governing Council (GC) Meeting of NAM S&T Centre, Mauritius, 27-28 July 2023

*රූපය 15: නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය මධ්‍යස්ථානයේ 16වන පාලක සභාව*

මධ්‍යස්ථානයේ සාමාජික රටවල් විසින් සංවිධානය කරනු ලබන වැඩමුළු, සම්මන්ත්‍රණ, ශිෂ්‍යත්ව සහ අනෙකුත් කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ විද්‍යාඥයින්ට සහ අනෙකුත් නිලධාරීන්ට අවස්ථාව සලසා දෙයි. පහත සඳහන් ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ට 2023 දී නාම් විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ වැඩසටහන් වලට සහභාගී වීමට අවස්ථාව ලැබුණු අතර 2024 සඳහා ද තෝරා ගන්නා ලදී:

**1. NAM S&T Center - JSS AHER, Mysuru, India ඒකාබද්ධ ශිෂ්‍යත්ව වැඩසටහන - 2022-23 සඳහා අයදුම්පත් කැඳවීම**

i. සිතාරා විනෝදනී, M.Phil, ෆාමසි සහ ඖෂධ විද්‍යා දෙපාර්තමේන්තුව, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**2. 2023 ජනවාරි 30-31, "ද්‍රව්‍ය, සැලසුම්, නවෝත්පාදන සහ පාවහන් සහ සම් නිෂ්පාදන බුද්ධිමත්ව නිෂ්පාදනය කිරීම පිළිබඳ නැගී එන ප්‍රවණතා" පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව**

i. සුරේෂ් අලුවිහාර මහතා, පර්යේෂක, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**3. "භෞමික පරිසරයේ ප්ලාස්ටික් දූෂණයට එරෙහිව සටන් කිරීම" පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව, 2023 මාර්තු 14-15**

i. මහාචාර්ය ෂර්මිලා ජයසේන, මහාචාර්ය, ජෛව රසායනය සහ අණුක ජීව විද්‍යා අංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

ii. ආචාර්ය කේ. පකීරතන්, ප්‍රධාන සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිකර්ම ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම පීඨය, යාපනය විශ්වවිද්‍යාලය

**4. 'ගෝලීය දකුණු සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්ති සැකසීම - 2023' පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන, ක්වාලාලම්පූර්, මැලේසියාව, 2023 ජූනි 6-8**

i. එම්.එම්.එම්.ජී.කේ. මීගහකොටුව මිය, අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), අධ්‍යාපන අමාත්‍යාංශය

**5. ඒකාබද්ධ නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය - ZMT Bremen (ජර්මනිය) "නිවර්තන වෙරළබඩ සමුද්‍ර පර්යේෂණවල blue economy" පිළිබඳ ශිෂ්‍යත්ව වැඩසටහන - 2024**

i. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඖෂධවේදය සහ ඖෂධ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඩබ්ලිව් ජේ ආරච්චිලගේ බනුකි නිරෝෂා ජයසූරිය

ii. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ භූ විද්‍යාව පිළිබඳ මහාචාර්ය මහාචාර්ය අමිල සඳරුවන් රත්නායක

**6. නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය - JSS AHER, Mysuru, India ඒකාබද්ධ ශිෂ්‍යත්ව වැඩසටහන -2024**

i. කාර්මික තාක්ෂණ ආයතනයේ පර්යේෂණ විද්‍යාඥ ආචාර්ය ගවිනි ලියනආරච්චි

**7. නොබැඳි සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ "සාමාන්‍ය ඖෂධ" පිළිබඳ ග්‍රන්ථය - පරිච්ඡේද දායකත්වය සඳහා**

i. ආචාර්ය A. ඉල්මුදීන්, කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, කළමනාකරණ සහ වාණිජ පීඨය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

ii. P. කල්කි මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඖෂධ දෙපාර්තමේන්තුව, සම සෞඛ්‍ය විද්‍යා පීඨය (UAHS), යාපනය විශ්වවිද්‍යාලය
iii. මහාචාර්ය චමිල මෙත්තානන්ද, ඖෂධවේදය පිළිබඳ මහාචාර්ය සහ සාමාන්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂඥ, වෛද්‍ය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

**8. NAM S&T මධ්‍යස්ථානය - ස්වභාවික නිෂ්පාදන රසායන විද්‍යාව, ඖෂධ සහ ඖෂධ පිළිබඳ ICCBS ඒකාබද්ධ ශිෂ්‍යත්ව වැඩසටහන - 2024**

අයදුම්පත් කැඳවීම ආරම්භ කර ඇත

## මානව සම්පත් කළමනාකරණය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විද්‍යා හා තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සම්පාදනයේ ප්‍රමුඛතම ආයතනය වශයෙන් සහ උපදේශක ආයතනය වශයෙන්ද පිහිටුවා ඇත. උක්ත කාර්යය ඉටු කරනු පිණිස, ආයතනික අරමුණු හා අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමෙහි ලා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරමින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව රට තුළ විද්‍යාව හා තාක්ෂණය සංවර්ධනය උදෙසා වූ ප්‍රයත්නයක නිරතව සිටී.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ ආයතනික ව්‍යුහයට අනුව සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි. අධ්‍යක්ෂවරයා වනුයේ ප්‍රධාන විධායක නිලධාරියාය. ආයතනික ප්‍රතිපත්ති, උපාය මාර්ගික සැලසුම් හා විද්‍යාව හා තාක්ෂණය ආශ්‍රිත සෙසු ලේඛන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයෝ හා විද්‍යාඥයෝ, පාර්ශවකරුවන් හා උපදේශන සංසද සමඟ සහාය දක්වමින් එක්ව කටයුතු කරති. නියෝජ්‍ය අධ්‍යක්ෂගේ (මුදල් හා පරිපාලන) මඟ පෙන්වීම යටතේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය හා පරිපාලන කළමනාකරණය සිදු කෙරේ. සහාය කාර්යමණ්ඩලය ලෙස පරිපාලන නිලධාරි, ආශ්‍රිත නිලධාරීන් දෙදෙනෙකු, (එනම්, වැඩසටහන් සහායක - මුදල්, හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ දත්ත ගබඩා සහකාර) කළමනාකරණ සහකාරවරුන් පස් දෙනෙකු, කාර්යාල කාර්ය සහායකයින් දෙදෙනෙකු හා රියැදුරන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. කොමිෂන් සභාවේ අනුමැතිය මත අවශ්‍යතාවය පදනම් කරගනිමින් නිශ්චිත කාර්යයන් හා පැවරුම් සඳහා පර්යේෂණ සහකාරවරුන්ගේ සේවය බාහිරින් ලබාගනු ලබයි.

## කාර්ය මණ්ඩල පුවත්

* 2022 මාර්තු 15 සිට 2023 නොවැම්බර් 13 දක්වා වැඩබලන අධ්‍යක්ෂ ලෙස කටයුතු කල ජනක එස්.ගීකියනගේ මහතාට කෘතඥතාවය පළ කරමු.

* වැඩබලන අධ්‍යක්ෂ ලෙස ගීතානි කන්නන්ගර මහත්මිය 2023 නොවැම්බර් 14 වන දින ආයතනය විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

* අයි.පි.සී.යු. ඉලංගකෝන් මහතා 2023 දෙසැම්බර් 12 වන දින කාර්යාල කාර්ය සහායක ලෙස ආයතනයට සම්බන්ධ විය.

## ධාරිතා ගොඩනැගීම /ගෘහස්ථ සහ බාහිර පුහුණු වැඩසටහන්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) විසින් 2023 සැප්තැම්බර් 04 සිට 08 දක්වා (දින 05) පවත්වන ලද "රාජ්‍ය අංශයේ සාමාන්‍ය හැසිරීම සහ විනය පරිපාටිය" පිළිබඳ වැඩමුළුවට පරිපාලන නිලධාරිනී ලක්මිණි උඩුගම මෙනවිය සහභාගී විය.

## සුභසාධන කටයුතු

2023 වර්ෂයේ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් කාර්යමණ්ඩලයේ නිලධාරින් සඳහා අඩු පොලී ණය පහසුකම් සහිතව රුපියල් 50,000 ක මුදලක් ලබා දෙන ලදී.

## ආයතනික පාලන වාර්තාව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ (NASTEC) බලතල සහ කර්තව්‍ය, 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ විධිවිධාන යටතේ අතිගරු ජනාධිපතිතුමන් විසින් පත්කරන ලද, සාමාජිකයන් සත් (07) දෙනෙකුගෙන් සැදුම්ලත් කොමිෂන් සභාව සහ එහි සභාපතිවරයා වෙත පැවරී ඇත.අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා කොමිෂන් සභාව සෑම මසකම රැස්වේ.

2023 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ සාමාජිකයන් පහත පරිදි විය.

මහාචාර්ය වෙරංජ කරුණාරත්න - සභාපති

දීපා ලියනගේ මිය - කොමිෂන් සභා සාමාජික

ආචාර්ය ඩී.එම්. සුරතිස්ස දිසානායක - කොමිෂන් සභා සාමාජික

මහාචාර්ය ඩී.එස්.ඒ විජේසුන්දර - කොමිෂන් සභා සාමාජික

ආචාර්ය කේ.ජී.අයි.අමරසිංහ - කොමිෂන් සභා සාමාජික

ආචාර්ය නිර්මලී ද සිල්වා - කොමිසමේ සාමාජිකාව

තුෂාර වජිර පෙරේරා මහතා - කොමිෂන් සභා සාමාජික

දිලූපා ප්‍රනාන්දු මිය - භාණ්ඩාගාර නියෝජිත

කොමිෂන් සභාව 2023 වර්ෂයේදී රැස්වීම් 11ක් පවත්වා පහත සඳහන් ප්‍රතිපත්තිමය තීරණ ගන්නා ලදී.

i. BICOST -IX තාක්ෂණික ප්‍රතිදාන (Technical Output) ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (නිර්දේශ).
ii. ප්‍රධාන පාර්ශවකරුවන්ගේ (NIA,NSF,UGC) උපදේශකත්වයෙන් උපකරණ (විද්‍යාත්මක) හුවමාරු කිරීමේ ප්‍රතිපත්තිය සකස් කිරීම
iii. සමාලෝචන ක්රියාවලිය වේගවත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම (ක්‍රියාත්මක කිරීම සහ මඟපෙන්වීම).

## විගණන හා කළමනාකරණ කමිටුව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව (AMC) පිහිටුවා ඇති අතර ආයතනයේ මෙහෙයුම් සහ කාර්ය සාධනය හා සම්බන්ධිත මූල්‍යමය ගැටලු සහ පාලනය අධීක්ෂණය කරනු පිණිස රැස්වීම් පවත්වනු ලබයි. එම කමිටුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයට වගකිව යුතුවේ.

ආයතනයේ අධීක්ෂණ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමෙහි ලා කමිටුව විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ආයතනික පාලනයට අදාළ මාර්ගෝපදේශ සහ රජය සතු ව්‍යාපාර සම්බන්ධ මෙහෙයුම් අත්පොතට අනුව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව කොමිෂන් සභා සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර භාණ්ඩාගාර නියෝජිතවරයා විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි. විගණන හා කළමනාකරණ කමිටුවේ ගණපූරණය සාමාජිකයන් ගණනින් බහුතරය වේ. ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු/ බාහිර විගණක සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා නිරීක්ෂකයන් වශයෙන් කටයුතු කරති.

විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් රැස්වන අතර 2023 වසර තුළදී රැස්වීම් 4 ක් පවත්වන ලදී. එමගින් නිවැරදි කිරීමේ පියවරයන් ගැනීමට අවශ්‍ය පහසුකම් සලසනු පිණිස රැස්වීමේ සාකච්ඡා සටහන්ද සමගින් සිය නිර්දේශ කොමිෂන් සභාව වෙත වාර්තා කරයි.

## මූල්‍ය ප්‍රකාශනය

### ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

**2023 දෙසැම්බර් මස 31වන දිනට අවසන් වසර සඳහා**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**
(සියලු මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

| වත්කම් | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 14,918,833 | 20,572,306 |
| කාර්ය මණ්ඩල ණය - දිගු කාලීන | 2 | 504,166 | 507,333 |
| | | **15,422,999** | **21,079,639** |
| **ජංගම වත්කම්** | | | |
| කාර්ය මණ්ඩල ණය - කෙටි කාලීන | 3 | 274,000 | 248,000 |
| පෙර ගෙවුම් | 4 | 16,336 | 6,883 |
| භාණ්ඩ ලේඛන/ තොග | 5 | 86,757 | 153,345 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 6 | 2,959,572 | 1,381,089 |
| **සමස්ත වත්කම්** | | **3,336,665** | **1,789,317** |
| **බැරකම්** | | **18,759,664** | **22,868,956** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විලම්බිත ආදායම | 7 | 758,012 | 758,012 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 8 | 4,960,405 | 4,524,786 |
| **ජංගම බැරකම්** | | **5,718,417** | **5,282,798** |
| උපචිත වියදම් | 9 | 4,111,346 | 1,416,791 |

| | | | |
|---|---|---|---|
| **සමස්ත බැරකම්** | | **<u>9,829,763</u>** | **<u>6,699,589</u>** |
| **සමස්ත ශුද්ධ වත්කම්** | | **<u>8,929,901</u>** | **<u>16,169,367</u>** |
| **ශුද්ධ වත්කම්/ හිමිකම** | | | |
| උපචිත අරමුදල | | 1,907,459 | 1,907,459 |
| ප්‍රති ඇගයුම් අතිරික්තය | | 26,259,433 | 26,259,433 |
| සංචිත | | <u>(19,236,991)</u> | <u>(11,997,525)</u> |
| **සමස්ත ශුද්ධ වත්කම්/ හිමිකම්** | | **<u>8,929,901</u>** | **<u>16,169,367</u>** |
| | | | |

01 හා 02 පිටුවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හා 07 සිට 11 දක්වා පිටුවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යාවශ්‍ය කොටසක් වේ. කොමිෂන් සභා සාමාජිකයන් මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම විෂයයෙහි වගකිව යුතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභා සාමාජිකයන් විසින් අනුමත කරන ලදුව ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

(අ/කළේ)
සභාපති

(අ/කළේ)
වැ.බ. අධ්‍යක්ෂ

(අ/කළේ)
නි. අධ්‍යක්ෂ
මුදල් හා පාලන

(අ/කළේ)
කොමිෂන් සභා සාමාජික

*රූපය 16: මූල්‍ය ප්‍රකාශනය*

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
### 2023 දෙසැම්බර් මස 31වන දිනට අවසන් වසර සඳහා
### මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

(සියලු මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

| වත්කම් | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | | 23,358,225 | 20,179,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන - පර්යේෂණ හා සංවර්ධන | | 4,000,000 | 2,040,000 |
| ද්විපාර්ශ්වික සමුළුව පැවැත්වීමට අනුග්‍රාහක දායකත්වය | | 2,390,000 | - |
| නැවත එකතු කළා - නාම් විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයට ගෙවිය යුතුවන දායක මුදල | 10 | 498,533 | 6,897,700 |
| ආදායම | 11 | 41,970 | 37,344 |
| | | **30,288,728** | **29,154,044** |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 12 | 12,555,903 | 10,389,312 |
| ගමන් වියදම් | 13 | 2,300 | 9,280 |
| පරිහරණය කළ සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය | 14 | 606,566 | 225,271 |
| නඩත්තු | 15 | 671,764 | 455,349 |
| කොන්ත්‍රාත් සේවා | 16 | 9,809,470 | 7,855,381 |
| මාරු කිරීම් | 17 | 449,845 | 380,973 |
| කාර්යමණ්ඩල ධාරිතා සංවර්ධනය | 18 | 356,870 | - |
| පර්යේෂණ හා සංවර්ධන | 19 | 7,057,074 | 961,593 |

| | | | |
|---|---|---|---|
| රැස්වීම් වියදම් | 20 | 364,930 | 345,649 |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම් | 1 | 5,653,472 | 3,587,878 |
| **සමස්ත වියදම්** | | **37,528,194** | **24,210,676** |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය/ (හිඟය)** | | **(7,239,466)** | **4,943,368** |
| **මූල්‍ය පිරිවැය** | | | |
| දේපළ, පිරියත හා උපකරණ අලෙවියෙන් ලද ලාභය | | | |
| **කාල පරිච්ඡේදය සඳහා වූ ශුද්ධ අතිරික්තය/ (හිඟය)** | | **(7,239,466)** | **4,943,368** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } IMT/D/NASTEC/1/23/124 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 මැයි 22 දින

සභාපති

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

3

77

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති /විධානයට යොමුව | නිරීක්ෂණ |
| --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 2021/01 දරන මුදල් අමාත්‍යාංශයේ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත් පොතෙහි 6.6 වගන්තිය | මුදල් වර්ෂය ආරම්භ වී මාස 05 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2021 හා 2022 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා මෙතෙක් සභාගත කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

ජාතික විද්‍යා හා තාක්ෂණික කොමිෂන් සභාව විසින් 2023 වර්ෂය සඳහා පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය අනුව වර්ෂය තුළ සැලසුම්කර තිබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 06 ක් සඳහා රු.මිලියන 20 ක් ප්‍රතිපාදනය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැය කර ඇති සත්‍ය වටිනාකම රු. මිලියන 4 ක් පමණක් වී තිබුණි. එය සමස්ථ වෙන්කිරීමෙන් සියයට 20 ක් වැනි අවම ප්‍රමාණයකි. එම ප්‍රතිපාදනයෙන් සේවක කාර්ය මණ්ඩල පුහුණු සඳහා රු. මිලියන 1.2 ක මුදලක් වෙන් කර තිබුණද විගණිත දිනය වන විට ඉන් සියයට 30 ක් පමණක් වැය කර තිබීම හේතුවෙන් මානව සම්පත් සංවර්ධනය කිරීම පිළිබඳ සැළකිලිමත්වීම ප්‍රමාණවත් මට්ටමක නොපැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව - පිළිතුරු**

**2.2.2** 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2024.04.02 දින හා 2022 වාර්ෂික වාර්තාව 2024.04.19 දින අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

**2.3 වෙනත් කරුණු**

2023 ක්‍රියාකාරී සැලැස්මට අදාලව 2023.12.31 දින වන විට මූල්‍ය ප්‍රගතිය 20% පමණ වුවද භෞතික ප්‍රගතිය 80% පමණ රඳවා ගැනීමට හැකිව තිබුණි.

අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය සපුරා ගැනීමට නොහැකි වීමට පහත කරුණු බලපාන ලදී.

i. රජයේ වියදම් පාලනය සඳහා නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ 3/2022 සහ 9/2022 පදනම් කර ගනිමින් 2023 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මේ ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් සියල්ල ක්‍රියාත්මක කිරීමට සිදු වූ අතර ඒ අනුව එම ක්‍රියාකාරකම් වල ක්‍රමවේදය වෙනස් කර සිදුකිරීම කරන ලදී.

   මෙම චක්‍රලේඛ වලට අනුව බොහෝ වැඩ සටහන් මාර්ගගත ක්‍රමවේදයට සිදු කරන ලදී. ඒ අනුව ඇස්තමේන්තු ගත කරන ලද පැමිණීමේ දීමනා, සංග්‍රහ වියදම්, ශාලා ගාස්තු, ප්‍රවාහන වියදම් ආදී වියදම් ඉතිරිකර ගැනීමට හැකි විය. තවද ආයතනයේ ප්‍රකාශන සහ සන්නිවේදන කටයුතු විද්‍යුත් මාධ්‍ය හරහා බොහෝ විට සිදුකල බැවින් එවැනි කටයුතු සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම් ඉතිරි විය.

ii. 2023 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබූ ප්‍රතිපත්ති සම්පාදන කටයුතු සඳහා ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගේ දායකත්වය ලබාගෙන සිදු කළ යුතු අතර ඉහත සඳහන් වියදම් පාලන චක්‍රලේඛ අනුව ගෙවීම් සීමා කර තිබූ බැවින් එම කාර්යයන් සැලසුම්කර තිබූ අන්දමින් සිදුකිරීමට නොහැකි විය.

iii. 2023 වර්ෂයේ අදාලව ආයතන සමාලෝචන ක්‍රියාවලියේදීද කොමිෂන් සභාව ලබා දුන් කාල රාමුව තුල අදාල ආයතන විසින් තොරතුරු ලබා නොදීම සහ විශේෂඥ කමිටු සාමාජිකයන්ගේ කාර්ය බහුලතාවය හේතුවෙන් අදාල සමාලෝචන කටයුතු ප්‍රමාද වීම නිසා වෙන්කළ මූල්‍ය ප්‍රතිපාදන ඉතිරිවිය.

රජයේ වියදම් පාලනය සඳහා නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ 01/2023 (ඇ) ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටිය අනුව ලබා දිය යුතු පුහුණු අවස්ථා හා අත්‍යවශ්‍ය පුහුණුවීම් අවස්ථා පමණක් කාර්ය මණ්ඩලය වෙත ලබා දෙන ලදී.

ජී.එස්. කන්නන්ගර


වැඩබලන අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.

## පසුගිය වසර 10 හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ

| වර්ෂය | මූල්‍ය තොරතුරු (රු. මිලියනයෙන්) | | |
|---|---|---|---|
| | වෙන් කිරීම | ලැබුණු අරමුදල් | වියදම් |
| 2014 | 37.00 | 27.84 | 27.93 |
| 2015 | 36.60 | 22.52 | 22.20 |
| 2016 | 36.00 | 32.16 | 33.50 |
| 2017 | 43.75 | 30.10 | 34.40 |
| 2018 | 45.00 | 43.20 | 38.96 |
| 2019 | 40.80 | 30.47 | 35.93 |
| 2020 | 35.10 | 26.36 | 28.91 |
| 2021 | 51.00 | 21.15 | 24.89 |
| 2022 | 49.00 | 22.22 | 20.62 |
| 2023 | 57.47 | 29.75 | 31.87 |

*වගුව 1: පෙර වසර 10 (2014-2023) හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ*

14 රූපය පසුගිය වසර 10 ක මූල්‍ය තත්ත්වය ප්‍රතිපාදන සහ ලැබුණු අරමුදල් අතර ප්‍රතිශතය සහ ලැබුණු අරමුදල් සහ වියදම් අතර ප්‍රතිශතය ලෙස පෙන්නුම් කරයි




*රූපය 17: පෙර වසර 10 (2013-2022) හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ*